ග්‍රාම නිලධාරි කොට්ටාශයේ නම නිර්මාණය වූ ආකාරය සහ ඓතිහාසික පසුබිම

"මාකලන්දව ග්‍රාමය" පිලිබඳ පුරාවෘත්ත සොයා යාමේදී මෙම නාමය පටබැඳි ඇති ආකාරය ජනප්‍රවාදයේ මෙසේ සඳහන් වේ. එම කතිකාව අනුරාධපුර යුගයේ අනුලා බිසව දක්වා දිව යයි. ඇය එකල අතිශය ශක්තිමත් කාන්තාවක් වූ අතර එකල රජවරුන් ඝාතනය කරවීම එකල ඇය විසින් සිදුකල කෲර ක්‍රියාවකි. ඒ වකවානුවේදී මාකලන්තිස්ස නොහොත් චෝර රාජ කුමාරවරුන්ටත් මේ අනුලා දේවියගෙන් තම ජීවිතය රැක ගැනීමට එම ප්‍රදේශයෙන් පලාවිත් සැඟවී සිටියේ වර්තමානයේ මාකලන්දාව නමින් හඳුන්වන ප්‍රදේශයේ ගිරිදුර්ගයකයි. මාකලන්තිස්ස කුමරු සැඟවී සිටී ගිරිදුර්ගය පිහිටා තිබුණු නිසා මාකලන්දාව ලෙස භාවිතා කර ඇති බව පැරැන්නන්ගේ මතයයි.

එසේම චෛරනාග හෙවත් මාකලන්තිස්ස කුමරු සැඟවී සිටී දුර්ගයට උතුරු දෙසින් බලගල නමැති කඳු ප්‍රදේශයක පිහිටා තිබූ අතර මෙම මාකලන්තිස්ස රජවරුන් ආහාර ගැනීමට පලතුරු වර්ග රාශියක් මෙම වනගත ප්‍රදේශයේ වගාකොට තිබූ අතර අදටත් එම පලතුරු බහුල වශයෙන් එම ප්‍රදේශ වල දක්නට ලැබේ. එම පලතුරු එම ප්‍රදේශය තුලදීම උවමනා ප්‍රමාණයට ආහාරයට ගැනීමට හැකි මුත් කිසිදු පළතුරක් එම සීමාවෙන් මෙපිටටගෙන ඒමට නොහැකි වන ලෙස අත්භූත බලවේගයක් ක්‍රියාත්මක වන බව පැරැන්නෝ පවසති.

වසමට ප්‍රවේශ වන ගමන් මාර්ගය

ප්‍රධාන ප්‍රවේශ මාර්ගය -

මෙම වසමට ප්‍රවේශ වීමට පොදුජන හෝ පොදු බස් රථයකින් පැමිණෙන්නේ නම් මතුගම නගරයේ සිට හොරවල මාර්ගයේ මීගහතැන්න දෙසට පැමිණ එම හන්දියෙන් වලල්ලාවිට මාර්ගයේ කිලෝමීටර 05 ක් පමණ පැමිණි විට මාකලන්දාව දකුණ ග්‍රාම නිළධාරී වසමට ප්‍රවේශ විය හැකිය.

එසේ ප්‍රවේශ වීමෙන් ආරම්භ වන වසමේ අතුරු මාර්ගකීපයක් ඇත. ප්‍රධාන මාර්ගයේ සිට ආරම්භයත් සමග දකුණු පැත්තට කන්දෙගෙවත්ත මාර්ගයද එය පසු කර මීටර් 100 ක් පමණ පැමිණි විට ගල් අමුණා මාර්ගයද හමුවේ. එම අතුරු මාර්ගය පසුකර ඉදිරියට පැමිනෙන විට පළමුවෙන් දකුණු පැත්තට උඩුමුල්ල මාර්ගයද එය පසු කළ විට වම් පැත්තට දුවවත්ත මාර්ගයද හමු වේ. වසමේ අවසානය ශ්‍රී සුදර්ශණාරාමය විහාරස්ථානය පසුකර මීටර් 200 කින් පමණ සිදු වේ.

අතුරු ප්‍රවේශ මාර්ගය -

මෙම වසමට පැමිණිය හැකි තවත් අතුරු මාර්ගයක් නම් මතුගම නගරයේ සිට පැලවත්ත හන්දියට පැමින වලල්ලාවිට මාර්ගයේ මගුරුමස්විල හන්දියෙන් දකුණට හැරී මීගහතැන්න දෙසට කිලෝමීටර එකහමාරක් පමණ පැමිණි විටද මෙම වසමට ප්‍රවේශ විය හැක.